# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2037/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 27/07/2024<br>පැය 1510 |

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කොස්ගම පොලිස් වසම.

2024.07.26 වන දින රාත්‍රී කාලයේ කොස්ගම පොලිස් වසමේ කළුඅග්ගල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පහරදීමක් හේතුවෙන් ඔහු අද දින උදෑසන නිවස තුළ මියගොස් සිටින බවට කොස්ගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වන කලුඅග්ගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ දියණිය සහ ඇගේ ස්වාමිපුරුෂයා අතර ඇති වූ ආරවුලකට මැදිහත් වීමේදී මරණකරුට බෑණා විසින් අතින් පයින් පහරදීමෙන් සිදු වූ මරණයක් බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත දේහය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කර ඇත. ඝාතනයට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර කොස්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2024.07.27 වන දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ හලාවත කොළඹ ප්‍රධාන මාර්ගයේ පෙරියමුල්ල ප්‍රදේශයේදී හලාවත දෙස සිට කොළඹ දෙසට මර්ගයේ ගමන් ගත් පා පැදිකරුවෙකු එම දෙසටම ධාවනය වූ කන්ටේනර් රථයට යටවීමෙන් අනතුරක් සිදු ව ඇත. අනතුරින් තුවාල ලැබූ පා පැදිකරු මීගමුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 16 වන වැල්ලවීදිය, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කන්ටේනර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - පයාගල පොලිස් වසම.

2024.07.27 වන දින උදෑසන කාලයේ පයාගල පොලිස් වසමේ කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ දළුවත්ත ප්‍රදේශයේදී අළුත්ගම දෙස සිට කළුතර දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දෙසටම ධවනය වූ බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී කළුතර දෙස සිට අළුත්ගම දෙසට ධාවනය වූ ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කළුතර නාගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 25 වන මග්ගොන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුතර නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු බස් රථයේ හා ලොරි රථයේ රියදුරන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති අතර පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**